කොත්මලේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව ජූනි 15 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
----------------------------------------

1.3.1 නොසැසඳු පාලන ගිණුම්.
----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.8,627,699ක් වූ ගිණුම් විෂයයන් 03කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ උපයෝගී ලේඛණවල දැක්වෙන රු.7,813,802ක ශේෂයන් අතර රු. 813,897ක නොසැසඳීමක් විය.

1.3.2 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්.
--------------------------------------------

(i) ලැබිය යුතු ගිණුම්
--------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 02ක එකතුව රු.22,182,516ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.836,042ක් වී තිබුණි.

(ii) ගෙවිය යුතු ගිණුම්
---------------------

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 02ක එකතුව රු.14,428,688ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.2,834,681ක් වී තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
-----------------------------------

හිමිකම් ඔප්පු හා පිඹුරුපත් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වටිනාකම රු.50,957,068ක් වන ඉඩම් හා ගොඩනැගිලි විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,434,742ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,182,728ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,252,014ක වර්ධනයක් දක්නට ලැබුණු අතර ඒ සඳහා ආදායම් විෂයන් 03ක වැඩිවීම හා වියදම් විෂයන් 02ක අඩුවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2015.12.31 දිනට හිඟ<br>2015.01.01 දිනට පැවති හිඟයෙන් | 2015.12.31 දිනට හිඟ<br>වර්ෂයේ බිල්කිරීම් වලින් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 1,005,153 | 576,325 | 3,464,093 | 3,001,952 | 428,828 | 462,141 | 890,969 |
| වෙළඳ බලපත්‍ර | - | - | 2,418,850 | 2,418,850 | - | - | - |
| කුලී | 121,910 | 36,000 | 2,408,860 | 2,408,584 | 85,910 | 276 | 86,186 |
| වෙනත් | 404,115 | 291,450 | 1,747,147 | 1,552,597 | 112,665 | 194,550 | 307,215 |

2.2.2 බලපත්‍ර ගාස්තු

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා මූල්‍ය පරිපාලන) රීති 59 සිට 66 ප්‍රකාරව සෑම වර්ෂයක්ම ආරම්භයේදී විධිමත් සමීක්ෂණයක් මඟින් සභාව ව්‍යාපාරිකයන්ගේ නම් බලපත්‍ර ලේඛණයට ඇතුළත් කර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 දැන්වීම් පුවරු ගාස්තු

(ආ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (I) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව හා 1988 අගෝස්තු 23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කොත්මලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් දැන්වීම් පුවරු 111කින් අයවිය යුතුව පැවති රු.549,480ක මුදලක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

2015 දෙසැම්බර් 31 දිනට රු.3,783,640ක මුද්දර ගාස්තු සහ රු.1,564,456ක උසාවි දඩ ලැබිය යුතුව තිබුණි.

2.2.5 අධිභාර

--------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂය තුළ පනවන ලද අධිභාර අනුව 2015 දෙසැම්බර් 31 දිනට රු.67,865ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධන ඇගයීම

-------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අරමුණු සාක්ෂාත් කර ගැනීම, තහවුරු කිරීම සඳහා පිළියෙල කර තිබූ පාලන වාර්තා මගින් භෞතික හා මූල්‍ය කාර්යය සාධනය සංසන්දනය කිරීමට නොහැකි විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ සිදුකරන අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදි අනාවරණය විය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

------------------------------

(අ). 2014 වර්ෂයේදී පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ සෙවිලි තහඩු ලබාදීමේ වැඩසටහන සඳහා අදාළ ප්‍රතිපාදන ලැබී නොතිබියදී සභා අරමුදලින් ඒ සඳහා රු.153,612 ක වියදමක් දරා තිබුණි.

(ආ). 2014 මන්ත්‍රී ආධාර යටතේ ලද ලීටර් 1000 වතුර ටැංකි 02ක්, ලීටර් 500 වතුර ටැංකියක් සහ මැදකුඹුර වත්ත සඳහා ලබාදී තිබූ පුටු 13 ක් බෙදා දීමකින් තොරව ගබඩාවේ පැවතුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ අංක 2015/01 දරන චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ ප්‍රාදේශීය සභාවට 2015 වර්ෂය සඳහා රු.6,000,000ක මුදලක් වෙන්කර තිබූ නමුත් දෙසැම්බර් 31 දින වන විට රු.2,128,630ක සංවර්ධන කටයුතු පමණක් සිදුකර තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.2 අයවැය පාලනය

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 04ක සියයට 21 සිට සියයට 99 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 21 සිට සියයට 458 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන, පරිපූරක සමඟ සසඳා බලා එක් එක් අය/වැය විෂයයන්ගේ අතිරික්තතා/ ඌණතා පිළිබඳ කරුණු පැහැදිලිකිරීමේ ප්‍රකාශයන් පිළියෙලකර ඉදිරිපත්කර නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

4.3.1 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

(අ). කොත්මලේ නව නගරයේ ඉදිකර ඇති සතිපොළ ගොඩනැගිල්ල වසර 07ක් භාවිතා කිරීමකින් තොරව වල් බිහිවී පවතින නමුත් එය නඩත්තු කිරීමට හෝ අරමුණුගත කාර්යයන්හි යෙදවීමට සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ). අංක J.D 4866 දරන නිසාන් කැරවන් වර්ගයේ ගිලන් රථය 2010 වර්ෂයේ සිට වසර 06කට අධික කාලයක් ධාවනයෙන් ඉවත්කර තිබුණු නමුත් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

4.3.2 වාර්ෂික සමීක්ෂණය

ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 අනුව සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව පරීක්ෂාකිරීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා දූර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ණයගැති හා ණය හිමි පාලනය
(ඉ) වත්කම්කළමණාකරණය